සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**50 S I, II**

43181

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2021(2022)
# கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2021(2022)
# General Certificate of Education (Ord. Level) Examination, 2021(2022)

නාට්‍ය හා රංග කලාව (සිංහල) I, II
நாடகமும் அரங்கியலும் (சிங்களம்) I, II
Drama and Theatre (Sinhala) I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරාගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කරගැනීමටත් යොදාගන්න.

## නාට්‍ය හා රංග කලාව (සිංහල) I

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

* පහත දැක්වෙන කවි, සිංදු හා ගීත ඇසුරෙන් අංක **1** සිට **4** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A
ආල වෙලා පියසේ පටන් – මම කෝල නැතිව සබයේ මෙදැන්
බාල මෙමගෙ වැරදි නොගන් – මෙම රාළහාමිල හට ආයුබොවන්

B
අසාලා කීවේ වගතුග සියල්ලක්
යොදාලා කියන්නේ බොරු බස් ඇසිල්ලක්
රවාලා කීවේ අපහට දෝසයක්
කපාලා දෙමිය ගමමහගෙ බරට ගාතයක්

C
සෝබමාන දේව පුරා සදිසි සාර ලක්දිවේ
සිංහලුන්ගේ නාරිගනාතීත කාලෙ සෝබනා

D
වෙදා නටන්නේ පළමු ව සබේට එන්නේ
යොදා කියන්නේ තාලෙට ගත වෙවුලන්නේ
කුදා වැනෙන්නේ සබයේ කොක් හඬ දෙන්නේ
විදා පාන්නේ අත්දෙක තැගි කියන්නේ

E
රුවිනා පුත් සඳසෙ බබලනා – සිරියා කොමළියෙ රැගෙනා දැන් බලනු මෙහසුනා
ගම්බිර මගෙ පිය නරවර – ගෙන් මෙහසුන ලැබුණි මෙවර
පෙම්බරියනි මෙනුවර හැර – යන්නට සිදුවිය සියපුර

**1.** කොහොඹා කංකාරිය ශාන්තිකර්මයට අයත් වන්නේ,
(1) A ය. (2) B ය. (3) D ය. (4) E ය.

**2.** පහතරට කෝලම් ගැමි නාට්‍යයට අයත් වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**3.** ලියනෝරා නාඩගමෙහි ඇතුළත් වන්නේ,
(1) B ය. (2) C ය. (3) D ය. (4) E ය.

**4.** චාල්ස් ඩයස් සූරින් ගේ නූර්තියකට අයත් වන්නේ,
(1) A ය. (2) C ය. (3) D ය. (4) E ය.

**5.** "සැප හා දුක මුසු වූ ලෝකයාගේ ස්වභාවය ආංගිකාදි අභිනය මගින් දැක්වෙන කල එය 'නාට්‍ය' යි පවසනු ලැබේ." මෙම ප්‍රකාශය ඇතුළත් වන්නේ,
(1) අභිනයදර්පණයෙහි ය. (2) කාව්‍යශාස්ත්‍රයෙහි ය.
(3) නාට්‍යශාස්ත්‍රයෙහි ය. (4) දශරූපයෙහි ය.

[දෙවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

6. පහත සඳහන් කලා අංග අතුරෙන් ප්‍රාසංගික කලා පමණක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) චිත්‍ර කලාව, නවකතාව, මුද්‍රා නාට්‍යය, සංගීතය සහ නාට්‍යය
(2) මූර්ති ශිල්පය, බැලේ, ගීත නාට්‍යය, මුද්‍රා නාට්‍යය සහ ඔපෙරා
(3) සංගීතය, මුද්‍රා නාට්‍යය, නර්තනය, ඔපෙරා සහ නාට්‍යය
(4) නාට්‍යය, නර්තනය, ටෙලි නාට්‍යය, මුද්‍රා නාට්‍යය සහ සංගීතය

7. 'නෘත්ත' සම්බන්ධ වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ලී කෙළි සහ සවරම් නැටුමෙහි දක්නට ලැබෙන්නේ නෘත්ත ලක්ෂණය යි.
(2) රිද්මයානුකූල චලන සමග අත් පා, ඇස්, මුහුණ මගින් භාවයන් ප්‍රකාශවන නර්තන විශේෂයකි.
(3) අභිනය මාර්ගයෙන් කිසියම් අර්ථයක් ප්‍රකට වේ.
(4) මනිපුරි හා භරත නැටුම් නෘත්ත ප්‍රභේදය සඳහා නිදසුන් වේ.

8. චිත්ත ඒකාග්‍රතාවෙන් යුතු ව සියුම් භාවයන් නිරූපණය කිරීමට හා රූපණ කාර්යය සාර්ථක කරගැනීමට නළුවාට බාහිර ව උපකාර වන අභිනය පිළිවෙළින්
(1) ආංගික හා සාත්ත්වික අභිනය නම් වේ.
(2) සාත්ත්වික හා වාචික අභිනය නම් වේ.
(3) ආහාර්ය හා ආංගික අභිනය නම් වේ.
(4) සාත්ත්වික හා ආහාර්ය අභිනය නම් වේ.

9. ලෝකධර්මී නාට්‍ය සම්ප්‍රදාය සම්බන්ධ වඩාත් ම නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) මෙම නාට්‍ය වේදිකා සැරසිලිවලින් තොර ය.
(2) රංගනය සඳහා සංගීතය අත්‍යවශ්‍ය අංගයකි.
(3) බොහෝ විට කාලීන කතා පුවත් පාදක කරගනී.
(4) රංගනයේ දී වෙස්මුහුණු භාවිත කිරීම මෙහි සුවිශේෂී ලක්ෂණයකි.

10. නාට්‍ය පෙළ සම්බන්ධ **අසත්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) නාට්‍ය පෙළෙහි ප්‍රබලත්වය සාර්ථක නාට්‍ය නිෂ්පාදනයට බලපායි.
(2) රංගවිධාන නාට්‍ය පෙළට අත්‍යවශ්‍ය අංගයක් නො වේ.
(3) නාට්‍ය නිර්මාණයට, රසාස්වාදයට මෙන් ම විචාරයට ද පදනම වන්නේ නාට්‍ය පෙළ යි.
(4) කිසියම් අවස්ථාවක්, සිද්ධියක් හෝ අත්දැකීමක් පාදක කොටගෙන නාට්‍ය පෙළ රචනා කෙරේ.

11. නාට්‍ය රචකයා විසින් ලියන ලද පිටපත සජීවී කලාවක් ලෙසට ප්‍රේක්ෂකයා වෙත ගෙනයාමට මූලික වන්නේ/වන්නෝ,
(1) නළු-නිළියෝ ය.
(2) නාට්‍ය නිෂ්පාදකයා ය.
(3) අර්ථපති ය.
(4) වේදිකා පරිපාලක ය.

12. රංගභූමි පාලක සතු වගකීම වන්නේ,
(1) නළු-නිළියන්ට දෙබස් මතක් කර දීම යි.
(2) ආලෝකකරණ ශිල්පියාට උපදෙස් දීම යි.
(3) අංග රචනා ශිල්පියාට සහාය වීම යි.
(4) දර්ශනයට අදාළ කටයුතු කළමනාකරණය කිරීම යි.

13. "වේදිකාව මත නළුවා ගීතයක් ගයමින් සිට ක්ෂණයකින් ඔහු පුලුන් රොදක් මෙන් සැහැල්ලුවෙන් ඇද වැටී පෙරළී යයි." මෙම අවස්ථාව සාර්ථක ව නිරූපණය කිරීමට ඔහු නියැළුණු රංග අභ්‍යාස වන්නේ පිළිවෙළින්
(1) තාපන අභ්‍යාස සහ සංවේදන අභ්‍යාස යි.
(2) කටහඬ අභ්‍යාස සහ තාපන අභ්‍යාස යි.
(3) කටහඬ අභ්‍යාස සහ ශිථිලකරණ අභ්‍යාස යි.
(4) සංවේදන අභ්‍යාස සහ කටහඬ අභ්‍යාස යි.

14. චරිතාංග අංග රචනය යොදාගන්නේ
(1) චරිතවල ගතිගුණ ඉස්මතු කිරීමට යි.
(2) නළුවන්ගේ බාහිර ස්වරූපය වෙනස් කිරීමට යි.
(3) නළු පෞරුෂය ඉස්මතු කිරීමට යි.
(4) නළු-නිළියන්ගේ දක්ෂතා ඔප් නැංවීමට යි.

15. නාට්‍යෝචිත අවස්ථාවක ලක්ෂණයක් වන්නේ,
(1) චරිත අතර සංවාද භාවිතය යි.
(2) ප්‍රබන්ධ කළ කතා පුවතක් තිබීම යි.
(3) සාමූහික රංගන ඇතුළත් වීම යි.
(4) චරිත අතර ගැටුමක් උද්ගත වීම යි.

16. පුළුල් කෝණයකින් මුළු වේදිකාව ආලෝකමත් කිරීමට යොදා ගනු ලබන්නේ,
(1) යොමු පහන් ය.
(2) ධාරාලෝක පහන් ය.
(3) අල්ට්‍රා වයලට් පහන් ය.
(4) ප්‍රක්ෂේපණ පහන් ය.

[තුන්වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka ,

- පහත දැක්වෙන වගුව ඇසුරෙන් අංක **17** සිට **20** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| නාට්‍යයේ නම | රචකයාගේ නම | අනුවර්තනය | මෙරට නිෂ්පාදක/අනුවර්තක |
|---|---|---|---|
| ද ප්‍රපෝසල් | A | මඟුල් ප්‍රස්තාව | යූ.ඒ. ගුණසේකර |
| ද චෙරි ඕචර්ඩ් | ඇන්ටන් චෙකොව් | මහගෙදර | B |
| ඉක්නෙවිටාශු | සොෆොක්ලීස් | C | බන්දුල ජයවර්ධන |
| D | රේ කූනි | රෝමය ගිනි ගනී | බන්දුල විතානගේ |

**17.** ඉහත වගුවේ A කොටුවට ඇතුළත් විය යුතු රචකයාගේ නම කුමක් ද?
(1) ගාර්ෂියා ලෝර්කා (2) බර්නාඩ් ෂෝ (3) හෙන්රික් ඉබ්සන් (4) නිකොලොයි ගොගොල්

**18.** ඉහත වගුවේ B කොටුවට ඇතුළත් විය යුතු අනුවර්තක ගේ නම කුමක් ද?
(1) කේ.බී. හේරත් (2) රංජිත් ධර්මකීර්ති (3) ජයලත් මනෝරත්න (4) සුගතපාල ද සිල්වා

**19.** ඉහත වගුවේ C කොටුවට අයත් අනුවර්තන නාට්‍යයේ නම කුමක් ද?
(1) අහස් මාළිගා (2) වෙස් මුහුණු (3) හිරු නැති ලොව (4) බෙර හඬ

**20.** ඉහත වගුවේ D කොටුවට අයත් නාට්‍යයේ නම කුමක් ද?
(1) ඇපල් කාට් (2) ද ඩ්‍රැගන් (3) රන් ෆෝ යුවර් වයිෆ් (4) ද ෆාදර්

**21.** මී බන්ධනය නැමැති නාට්‍යමය අවස්ථාව ඇති ශාන්තිකර්මය කුමක් ද?
(1) කිරි මඬුව (2) දෙවොල් මඬුව (3) පූනා මඬුව (4) පහන් මඬුව

**22.** නූතන රංග භූමිය මනඃකල්පිත ව බෙදා ඇති කොටස් ගණන කීය ද?
(1) හයයි (2) අටයි (3) නවයයි (4) දහයයි

**23.** ඓතිහාසික කතා පුවතක් ඇසුරෙන් නාට්‍යයක් නිර්මාණයේ දී,
(1) එම යුගයේ භාෂා ව්‍යවහාරයට අනුගත විය යුතු ය.
(2) වර්තමාන සමාජයට අදාළ පණිවිඩයක් ඇතුළත් විය යුතු ය.
(3) ගීත ඇතුළත් විය යුතු ය.
(4) ඓතිහාසික සිද්ධි අනුපිළිවෙළ වෙනස් නොකළ යුතු ය.

**24.** එම්.එච්. ගුණතිලකගේ සක්කාය දිට්ඨි නාට්‍යය නිර්මාණය කරනු ලැබූයේ කිනම් ගැමි නාට්‍ය විශේෂය ආභාසය කොටගෙන ද?
(1) සොකරි (2) කෝලම් (3) නාඩගම් (4) පාස්කු

- පහත දැක්වෙන ඡායාරූප ඇසුරෙන් අංක **25** සිට **28** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


**A**


**B**


**C**


**D**


**E**

**25.** ස්වතන්ත්‍ර නාට්‍ය රචනයෙහිලා ප්‍රසිද්ධ වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**26.** මධුර ජවනිකා හා ආනන්ද ජවනිකා නිර්මාණයෙහිලා සම්බන්ධ වන්නේ,
(1) A ය. (2) B ය. (3) D ය. (4) E ය.

**27.** ආර්.ආර්. සමරකෝන්ගේ කැලණි පාලම නාට්‍යයේ රංගනයට සම්බන්ධ දෙදෙනා වන්නේ,
(1) A සහ C ය. (2) B සහ C ය. (3) C සහ D ය. (4) C සහ E ය.

**28.** නාට්‍යධර්මී ශෛලියෙන් රඟපෑමට වඩාත් ප්‍රවීණතාවක් දක්වනුයේ,
(1) A සහ C ය. (2) A සහ D ය. (3) C සහ D ය. (4) D සහ E ය.

**29.** භව කඩතුරාව සහ මීපුර වැසියෝ යන නාට්‍ය දෙක සඳහා රංගනයෙන් දායක වූයේ
(1) නීල් අලස් ය. (2) චාන්දනී සෙනෙවිරත්න ය.
(3) සුමින්ද සිරිසේන ය. (4) දීපානි සිල්වා ය.



Department of Examinations Sri Lanka ,
Department of Examinations Sri Lanka ,